දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2018 පරීක්ෂණය (2015 පුනර්) - 2018 සැප්තැම්බර්/ඔක්තෝබර්
First Examination in Arts (External) 2018 (Repeat 2015) – September/October 2018

ඉප්‍ර 1.1 - ශ්‍රී ලංකාවේ ඉතිහාසය (ආරම්භයේ සිට ක්‍රි.ව. 1500 දක්වා)
HY 1.1 – History of Sri Lanka (From the beginning to 1500 AD)

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරන ලැබේ

---

01. දහතුන්වන සියවස අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය කෙරෙහි භූගෝලීය සාධක බලපෑ ආකාරය පහත දැක්වෙන මාතෘකා ඇසුරෙන් සාකච්ඡා කරන්න.
   (i) ඉන්දියාවට ආසන්නයේ පිහිටීම
   (ii) ගංගාවල වැදගත්කම

02. "මහින්දාගමනය හුදෙක් නව ආගමක් හඳුන්වා දුන්නා පමණක් නොව ශ්‍රී ලාංකික සංස්කෘතිය පෝෂණයටද ඉවහල් විය" ඔබ ඉහත ප්‍රකාශයට එකඟවන්නේ දැයි සහේතුකව හේතු දක්වන්න.

03. "මහසෙන් රජු බොහෝ පින්ද බොහෝ පව්ද රැස් කළේය" මහසෙන් රජුගේ කාර්ය සාඵල්‍යය සම්බන්ධයෙන් ඉහත මහාවංශ ප්‍රකාශය විචාරාත්මකව විභාග කරන්න.

04. පහත දැක්වෙන ශීර්ෂ යටතේ අනුරාධපුර යුගයේ පැවති ආර්ථිකයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.
   (i) කෘෂිකර්මය
   (ii) වෙළෙඳාම

05. <u>එක්කෝ</u>
I විජයබාහු රජුගේ දේශපාලන හා සංස්කෘතික කාර්යභාරය මූලාශ්‍ර ඇසුරෙන් සාකච්ඡා කරන්න.

<u>නැතහොත්</u>
I පරාක්‍රමබාහු රජු දිවයින එක්සත් කිරීමට හා බුදු දහමට සිදු කළ මෙහෙය විමර්ශනාත්මකව අගය කරන්න.

06. රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය හා බිඳ වැටීමට තුඩු දුන් ප්‍රධාන සාධක කවරේ ද?

07. "දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍ය සමය ශ්‍රී ලංකා ඉතිහාසයේ අතිශය වැදගත්කමකින් යුක්ත වේ" සාකච්ඡා කරන්න.

08. පහත දැක්වෙන මාතෘකා පායා අතුරින් ඕනෑම දෙකක (02) ඓතිහාසික වැදගත්කම පිළිබඳ සටහන් ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස පිහිටුවීම
(ii) දිවයින එක්සත් කිරීමෙහිලා මාගම පාලකයන්ගේ දායකත්වය
(iii) අනුරාධපුර රාජධානියට එල්ල වූ විදේශ ආක්‍රමණ
(iv) පොළොන්නරු යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය
(v) කෝට්ටේ VI පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ වැදගත්කම

*******************************